C
378
DAY

# විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවේශයන් පිළිබඳ (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සහභාගි කර ගනිමින් කෙරෙන) අධ්‍යයනයක්

# A STUDY OF LEARNING APPROACHES OF THE UNIVERSITY STUDENTS (Based on the students of University of Peradeniya)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

1994

සෝමසිරි දයාරත්න

සමාජ විද්‍යා ඩිප්ලෝමා, අධ්‍යාපනවේදී (විශේෂ)

පර්යේෂණ උපදේශක

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී, ආචාර්ය සිල්වි ජේනාධීර මහත්මිය.

471431

UNIVERSITY OF PERADENIYA
15-11-1995
LIBRARY

## සාරාංශය

විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ ඉගෙනීම හා සම්බන්ධ වන මෙම පර්යේෂණ නිබන්ධනය, පරිච්ඡේද හයකින් සමන්විත වේ. පර්යේෂණයේ අවශ්‍යතාව හා අරමුණු පිළිබඳව කරුණු පැහැදිලි කිරීම පළමු වන පරිච්ඡේදයෙන් සිදුවේ.

ඉගෙනීමේදී පෘෂ්ඨීය, ගැඹුරු සහ සාධන යනුවෙන්, ත්‍රිවිධාකාර ප්‍රවේශයන් පවතින බව, විදේශයන්හි පාසල්වල සහ උසස් අධ්‍යාපන ආයතන වල සිසුන් ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණ මගින් පෙනීගොස් තිබේ. ඉහත කී ත්‍රිවිධාකාර ප්‍රවේශයන් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් අතරද පවතින්නේ දැයි සොයා බැලීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වලින් එකක් විය. දෙවන ප්‍රධාන අරමුණු වූයේ තත්කාලීන විශ්වවිද්‍යාලයීය ඉගෙනුම් වාතාවරණය විසින් ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ප්‍රවේශයන් ශක්තිමත් වීම කෙරෙහි ඇති කෙරෙන බලපෑම හඳුනා ගැනීමයි. අධ්‍යයන පීඨ හා ඉගෙනුම් ප්‍රවේශයන් අතර සම්බන්ධතාවයක් පවතින්නේද යන්න හඳුනා ගැනීමත්, ස්ත්‍රී පුරුෂභාවය හා ඉගෙනුම් ප්‍රවේශයන් අතර පවතින සම්බන්ධතාවය විමසා බැලීමත්, ශිෂ්‍යයින්ගේ විභාග ප්‍රතිඵල හා ඉගෙනුම් ප්‍රවේශයන් අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීමත් යන ඒවා සුවිශේෂ අරමුණු විය.

පර්යේෂණ ක්ෂේත්‍රය වූ විශ්වවිද්‍යාලයීය ඉගෙනුම් වාතාවරණය හා ඉගෙනුම් ප්‍රවේශයන් සම්බන්ධ සංකල්ප පැහැදිලි කිරීමත්, පර්යේෂණය සඳහා පසුබිම සකස්වූ ආකාරය පිළිබඳව සාහිත්‍යමය විමර්ශනයක් කිරීමත් දෙවන පරිච්ඡේදයේදී සිදුවේ.

කල්පිත පරීක්ෂාවේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ, ප්‍රශ්නාවලීන් භාවිතා කිරීම සහ සම්මුඛ සාකච්ඡා සැලැස්මක් ක්‍රියාත්මක කිරීමයි. ඉගෙනුම් ප්‍රවේශයන් හඳුනා ගැනීම සඳහාත්, ඉගෙනුම් වාතාවරණය පිළිබඳ තොරතුරු විමසා බැලීම සඳහාත් භාවිතා කළ හැකි පර්යේෂණ උපකරණ මෙරට නොවූයෙන්, පිටරටවලින් ගෙන්වාගත් ප්‍රශ්නාවලීන් ශ්‍රී ලංකාවට ගැලපෙන ආකාරයෙන් සකස්

කොට භාවිතා කිරීමට සිදුවිය. ඉහත කී උපකරණ හැඳින්වීම, ඒවා භාවිතා කළ ආකාරය, නියැදිය තෝරාගත් ආකාරය සහ සම්මුඛ සාකච්ඡා මෙහෙයවූ ආකාරය පිළිබඳව තොරතුරු ඇතුළත් වන්නේ තෙවන පරිච්ඡේදයේය.

සිව්වන පරිච්ඡේදයේදී, පර්යේෂණ අරමුණු වලට අදාලව සපයාගත් දත්ත විශ්ලේෂණය කිරීමත්, ප්‍රතිඵල සාකච්ඡා කිරීමත් සිදුවන අතර, එහිදී හෙළිවූ කරුණු අනුව එළඹිය හැකිවූ නිගමන ඉදිරිපත් කිරීම පස්වන පරිච්ඡේදයේදී සිදුවේ.

ඉගෙනුම් ප්‍රවේශයන් පිළිබඳව බැසගත හැකිවූ වැදගත් නිගමනයන් වූයේ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින් අතරින් සුළු පිරිසක් ගැඹුරු ඉගෙනුම් ප්‍රවේශය සහිත අය , බවත්, විශේෂයෙන් ශාස්ත්‍රපීඨයේ වැඩි පිරිසක් පෘෂ්ඨීය සහ සාධන ඉගෙනුම් ප්‍රවේශයන් සහිත බවත්ය.

තත්කාලීන ඉගෙනුම් වාතාවරණය මගින් ඇති කෙරෙන බලපෑම් කරණ කොටගෙන, පෘෂ්ඨීය හා සාධන ඉගෙනුම් ප්‍රවේශයන් ශක්තිමත් වන බව පැහැදිලි විය. ඉගෙනුම් ප්‍රවේශයන් හා අධ්‍යයන පීඨ අතර සම්බන්ධතාවයන් පවතින නමුත් ස්ත්‍රී පුරුෂ භාවය හා ඉගෙනුම් ප්‍රවේශයන් අතර සම්බන්ධතාවයක් නො පවතින බව පෙනී ගියේය. විභාග වලදී ගැඹුරු ඉගෙනුම් ප්‍රවේශය සහිත අය පෘෂ්ඨීය හා සාධන ප්‍රවේශයන් සහිත සිසුන්ට වඩා උසස් දස්කම් දක්වන බව පැහැදිලි විය.

පෘෂ්ඨීය සහ සාධන ඉගෙනුම් ප්‍රවේශයන් අනුගමනය කරන්නන් තුළ ගැඹුරු ඉගෙනුම් ප්‍රවේශය ශක්තිමත් වන ආකාරයට, විශ්වවිද්‍යාලයීය ඉගෙනුම් වාතාවරණයෙහි, සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳ අදහස් හා නිබන්ධනයේ සමාප්තිය හයවන පරිච්ඡේදයේ ඇතුළත් වේ.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY